# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2287/26 - 2022 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1)(අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ම විසින් 2022 ජූනි මස 09 දිනැති අංක 2283/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය සහ 2022 ජූනි මස 27 දිනැති අංක 2286/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මගින් සංශෝධිත, 2022 මැයි මස 27 වැනි දිනැති අංක 2281/41 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය, 2022 ජූලි මස 07 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි, පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2022 ජූලි මස 07 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක "1. ආරක්ෂක අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 17 අයිතමය ඉවත් කිරීමෙන්;

(2) එම නිවේදනයෙහි අංක "18. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 3 සහ 4 අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ආ) එහි II වැනි තීරුවෙහි අංක 5 සිට 21 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 3 සිට 19 දක්වා වශයෙන් නැවත අංකගත කිරීමෙන්;

(3) එම නිවේදනයෙහි අංක "29. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය " ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 7 අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන්;

08. රක්නා ආරක්ෂණ ලංකා සමාගම
09. සෙලෙන්දිව ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
10. හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම (PQ 143)

EOG 07-0032


1A - G 37047 — 366 (2022/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*